සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2016 ජූලි

## (AA35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

2016-07-17
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

රාජ්‍ය වියදම් සඳහා අරමුදල් රැස්කර ගැනීමේ මූලික පරමාර්ථයෙන් රජය බදු පනවයි. රටක බදු පද්ධතිය සාමාන්‍යයෙන් බදු මූලධර්ම සමූහයක් මත රඳා පවතී. ඒවා පුළුල්ව පිළිගත් විධිමත් මඟපෙන්වීම් (guidelines) වන අතර බදු නීති ඉදිරිපත් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතුය.

ඕනෑම බදු මූලධර්ම පහක්(05) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] පනතේ විධිවිධානයන්ට අනුව එකතු කළ අගය මත බද්දට යටත් වන ක්‍රියාකාරකම් **සඳහන් කරන්න**.

(ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත ඇග්‍රි සීඩ්ස් (පෞද්ගලික) සමාගම,** ප්‍රමුඛ පෙළේ බීජ නිෂ්පාදන සමාගමකි. සමාගම, ශ්‍රී ලංකාවේ බීජ නිෂ්පාදනය කිරීම මෙන්ම විදේශීය රටවලින් බීජ ආනයනය කිරීමද සිදුකරයි. **සීමාසහිත ඇග්‍රි සීඩ්ස් (පෞද්ගලික) සමාගම** පසුගිය තක්සේරු වර්ෂයේදී ගලපන ලද බදු අලාභයක් ලබා ඇති අතර පහත සඳහන් තොරතුරු 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුවට අදාල වේ:

| | **රු.** |
|---|---:|
| බීජ විකිණීම - සමාගම විසින් නිපදවන ලද | 54,650,000 |
| බීජ විකිණීම - ආනයනික | 12,650,000 |
| කාර්යාල උපකරණ විකිණීමෙන් ලද මුදල් | 2,225,000 |
| පොලී ආදායම | 750,000 |
| | **70,275,000** |

**ඔබ විසින් කළ යුතු දෑ,**

2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා **සීමාසහිත ඇග්‍රි සීඩ්ස් (පෞද්ගලික) සමාගම** විසින් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව [Economic Service Charge (ESC)] **තක්සේරු කරන්න.** (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත පේපර්ස් (පෞද්ගලික) සමාගම,** කඩදාසි වර්ග තොග සහ සිල්ලර වෙළදාමේ නිරතව සිටියි. 2014 දෙසැම්බර් මාසයේදී සමාගමේ ගබඩාව ගංවතුරට හසුවීම නිසා රු.500,000/- ක් වටිනා භාණ්ඩ හානියට පත්විය. රු.300,000/- ක රක්ෂණ වන්දියෙන් පසු, අලාභය රු.200,000/- කට අඩු විය. ආදායම් බදු වගකීම ගණනය කිරීමේදී සමාගම රු.200,000/- ක ශුද්ධ අලාභය, අඩුකිරීමක් ලෙස සලකා ඇත. තක්සේරුකරු මෙම මුදල ඉඩ නොදෙන අයිනමයක් ලෙස තක්සේරු කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ,**

දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට අනුව තක්සේරුකරුගේ තීරණය නිවැරදිදැයි **පැහැදිලි කරන්න**.

(ඔබේ තීරණය මේ සම්බන්ධ විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් තහවුරු කරන්න).

(ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

<u>**B කොටස**</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

2014 අප්‍රේල් 01 දින, **සුරේෂ්** සහ **නරේෂ්** විසින් හවුල් ව්‍යාපාරයක් ලෙස කෙටි ආහාර අලෙවිසැලක් (pastry shop) ආරම්භ කරන ලදි. ලාභා'ලාභ 1 : 1 අනුපාතයට බෙදා ගැනීමට ඔවුහු එකඟ වූහ. 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | රු. | රු. |
|---|---|---|
| දළ ලාභය | | 1,740,000 |
| **එකතු කළා:** <u>වෙනත් ආදායම්</u> | | |
| ඉතිරිකිරීමේ ගිණුම මත ලද පොලී ආදායම | 8,000 | 8,000 |
| | | 1,748,000 |
| **අඩු කළා:** <u>වියදම්</u> | | |
| **නරේෂ්ට** ගෙවූ කුලිය | 120,000 | |
| ක්ෂය වීම් | 20,000 | |
| වැටුප් - **සුරේෂ්** | 192,000 | |
| වැටුප් - **නරේෂ්** | 192,000 | |
| වෙනත් වියදම් | 378,000 | 902,000 |
| **ශුද්ධ ලාභය** | | **846,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන්නේ **නරේෂ්ට** අයත් ගොඩනැගිල්ලක වන අතර, ඔහුට මසකට රු.10,000/- බැගින් කුලී ගෙවා ඇත.

(2) ව්‍යාපාරය ආරම්භ කරන ලද අවස්ථාවේදී, රු.90,000/- ක් පිරිවැය වූ උපකරණ මිලට ගන්නා ලදි.

(3) පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු අඩුකර නැත.

(4) ඉඩ නොදෙන වියදම් කිසිවක් වෙනත් වියදම් වල ඇතුලත් නොවේ.

ඉහත තොරතුරු පදනම් කර ගනිමින්,

**ඔබ විසින් කළ යුතු දෑ,**

(a) හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය **ගණනය කරන්න**. (ලකුණු 04)

(b) හවුල් ව්‍යාපාරයේ ආදායම් බදු බැඳියාව **ගණනය කරන්න**. (ලකුණු 02)

(c) හවුල් ව්‍යාපාරයෙන් පැන නගින ලාභ සහ වෙනත් ආදායම් හවුල්කරුවන් අතර බෙදාහැරීමේ ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත ස්පයිසි වල්ඩ් (පෞද්ගලික) සමාගම,** කුළුබඩු සහ ආහාර වර්ග නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක නිරතව සිටින සමාගමකි. 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා, පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත:

(1) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුලදී, සමාගම විසින් කරන ලද සැපයුම්වල වටිනාකම (එකතුකළ අගය මත බදු [Value Added Tax (VAT) රහිතව]:

| කරන ලද සැපයුම් | වටිනාකම් |
|---|---|
| සෘජු අපනයන (ඇමරිකානු ඩොලර් 1 = රු.130/-) | ඇමරිකානු ඩොලර් 12,500 |
| අත්හිටුවනු ලද සැපයුම් (Suspended Supplies) ලෙස අපනයනකරුවන්ට කළ විකුණුම් | රු.845,000 |
| දේශීය වෙළෙඳපොලට කළ විකුණුම් | රු.2,850,000 |

(2) සමාගම, දේශීය මිලට ගැනුම් මත එකතුකළ අගය මත යෙදවුම් බදු (input VAT) ලෙස රු.144,600/- ක් ගෙවා ඇත.

(3) රු.16,500/- ක එකතුකළ අගය මත බදු මුදලක් පෙන්නුම් කෙරෙන, බදු බැර පතක් (tax credit note) දේශීය සැපයුම්කරුවෙකුගෙන් සමාගමට ලැබී ඇත.

(4) පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙන ආ වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද රු.74,000/- කි.

(5) අත්හිටුවන ලද සැපයුම් වෙනුවෙන් රු.92,950/- ක අත්හිටුවන ලද එකතුකළ අගය මත බදු බැර වවුචර් [Suspended VAT Credit Vouchers (SVCV)] ලැබී ඇත.

(6) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා එකතු කළ අගය මත බදු වාරිකය වශයෙන් රු.80,000/- ක් ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි එකතුකළ අගය මත බද්ද **තක්සේරු කරන්න**.

(ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සිරිවර්ධන, සිරි ටුවර්ස්හි** හිමිකරුවා වේ. ඔහුට වෙනත් ආදායම් ප්‍රභවයන් කිපයක් ද තිබේ. ඔහු 2014/15 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව තවමත් ඉදිරිපත් කර නැත. ඔබ **සිරිවර්ධනගේ** බදු උපදේශකවරයා වේ.

**ඔබ විසින් කළ යුතු දෑ,**

(a) 2014/15 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) නියමිත දින හෝ ඊට පෙර ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අත්වන ප්‍රතිලාභ **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමට අසමත් වීම මත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ගනු ලැබිය හැකි ක්‍රියාමාර්ග දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(d) නියමිත දිනට ආදායම් වාර්තාව ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් වන දණ්ඩනය, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩුකළ හැකි හෝ අත්හරිනු ලැබිය හැකි අවස්ථා **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

වර්ෂ 2010 දි සංස්ථාපනය කරන ලද වාසික සමාගමක් වන **සීමාසහිත ග්ලාස් ඩෙකෝ (පෞද්ගලික) සමාගම,** යුරෝපීය වෙළෙඳපොල සඳහා විසිතුරු වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක නිරතව සිටී. සමාගමේ මව් සමාගම වන්නේ ඉන්දියාවේ සංස්ථාපනය කර ඇති **සීමාසහිත ඩෙකෝ ග්ලෝබල් සමාගමයි.**

2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ග්ලාස් ඩෙකෝ (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශන වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) **1 වන සටහන -** 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙර ශුද්ධ ලාභය රු.17,489,450/- ක් විය. ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකර ඇත.

**1.1 සටහන - විදේශ ගමන්**

වර්ෂය තුලදී, නිෂ්පාදිත වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා උපයෝගි කර ගත හැකි නව නිෂ්පාදන ශිල්පීය ක්‍රම අධ්‍යයනය කිරීම සඳහා නිෂ්පාදන කළමනාකරු ඉන්දියාවේ සංචාරය කරන ලදි. ඔහුගේ විදේශ සංචාරයේ පිරිවැය රු.265,000/- ක් විය.

ජර්මනියේ පවත්වන ලද වෙළෙඳ ප්‍රදර්ශනයකට සමාගමේ අලෙවිකරණ කණ්ඩායම සහභාගි වූ අතර එම සංචාරයේ පිරිවැය රු.540,000/- ක් විය.

**1.2 සටහන - ප්‍රචාරණය**

සමාගම වර්ෂය තුලදී පහත සඳහන් ප්‍රචාරණ වියදම් දරා ඇත:

| | **රු.** |
|---|---|
| යන්ත්‍රයක් විකිණීම සඳහා පුවත්පත් දැන්වීම | 15,000 |
| විදේශීය මාධ්‍යයන්හි ප්‍රචාරණ දැන්වීම් | 1,200,000 |
| **එකතුව** | **1,215,000** |

**1.3 සටහන - පර්යේෂණ සහ සංවර්ධන වියදම්**

වර්ෂය තුලදී, නිෂ්පාදිත වල ගුණත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් පර්යේෂණ ආයතනයක් මගින් පර්යේෂණයක් සිදුකරන ලදි. මේ සඳහා සමාගම, රු.1,000,000/- ක් පර්යේෂණ ආයතනයට ගෙවා ඇත.

**1.4 සටහන - රාජ්‍ය භාග (Royalty)**

වර්ෂය තුලදී, සමාගම රු.1,000,000/- ක රාජ්‍ය භාගයක් එහි මව් සමාගම වෙත ගෙවා ඇත.

**1.5 සටහන - පරිත්‍යාග**

කොළඹ ජාතික රෝහලේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් සමාගම රු.600,000/- ක් සෞඛ්‍ය අමාත්‍යාංශයට පරිත්‍යාග කර තිබේ.

(2) **2 වන සටහන** - වෙනත් ආදායම් හි පහත දෑ ඇතුලත් වේ:

| | රු. |
|---|---|
| අපනයන සංවර්ධන මණ්ඩලයෙන් ලද අපනයන සංවර්ධන ප්‍රතිදාන (Rebate) | 500,000 |
| යන්ත්‍රයක් විකිණීමෙන් ලද ලාභය | 180,000 |
| විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයෙන් [Foreign Currency Banking Unit (FCBU)] ලද පොලී ආදායම | 265,000 |

(3) **3 වන සටහන** - දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත පරිදි වේ:

**පිරිවැය**

| වත්කම් | 2014 අප්‍රේල් 01 දිනට ශේෂය රු. | එකතු කිරීම් රු. | ඉවත් කිරීම් රු. | 2015 මාර්තු 31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| ඉඩම | 2,000,000 | - | - | 2,000,000 |
| ගොඩනැගිලි | 12,000,000 | - | - | 12,000,000 |
| ගෘහ භාණ්ඩ | 860,000 | - | - | 860,000 |
| පිරියත සහ යන්ත්‍ර | 8,540,000 | 2,400,000 | 1,250,000 | 9,690,000 |
| පරිගණක | 435,000 | - | - | 435,000 |
| කාර්යාල උපකරණ | 236,000 | 42,000 | - | 278,000 |
| | **24,071,000** | **2,442,000** | **1,250,000** | **25,263,000** |

**ක්ෂය වීම්**

| වත්කම් | 2014 අප්‍රේල් 01 දිනට ශේෂය රු. | වර්ෂය සඳහා අයකිරීම රු. | ඉවත් කිරීම් රු. | 2015 මාර්තු 31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 4,800,000 | 1,200,000 | | 6,000,000 |
| ගෘහ භාණ්ඩ | 688,000 | 34,400 | | 722,400 |
| පිරියත සහ යන්ත්‍ර | 6,832,000 | 341,600 | 1,000,000 | 6,173,600 |
| පරිගණක | 348,000 | 17,400 | | 365,400 |
| කාර්යාල උපකරණ | 188,800 | 9,440 | | 198,240 |
| | **12,856,800** | **1,602,840** | **1,000,000** | **13,459,640** |

**3.1 සටහන**

සමාගම 2014 මැයි 01 දින පැරණි යන්ත්‍රයක් විකුණූ අතර, පැරණි යන්ත්‍රය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා 2014 සැප්තැම්බර් 01 දින නව යන්ත්‍රයක් මිලදී ගන්නා ලදි.

**3.2 සටහන**

2014 අප්‍රේල් 01 දිනට පැවති දේපළ, පිරියත සහ උපකරණ සියලුම අයිතමයන් 2010/11 තක්සේරු වර්ෂයේදී සමාගම එහි මෙහෙයුම් ආරම්භ කිරීමේදී අත්පත් කරගත් ඒවා බව උපකල්පනය කරන්න.

(4) **4 වන සටහන -** වෙනත් අදාල තොරතුරු:

**4.1 සටහන**

2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ තක්සේරු වර්ෂය සඳහා සමාගමේ බදු අරමුණු සඳහා ගලපන ලද ව්‍යාපාර ලාභය රු.12,500,000/- කි.

**4.2 සටහන**

2013/14 තක්සේරු වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද බදු සඳහා ව්‍යාපාර අලාභය රු.2,435,000/- කි.

**4.3 සටහන**

2014/15 තක්සේරු වර්ෂය වෙනුවෙන් රු.750,000/- ක ස්වතක්සේරු බදු ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2014/15 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(b) තක්සේරු කළ හැකි ආදායම,

(c) බදු අයකළ හැකි ආදායම,

(d) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(e) ගෙවිය යුතු ඉතිරි බද්ද.

**සැ.යු:** යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි. (ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

වාසික පුද්ගලයෙකු වන **රණසිංහ,** ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ බිස්කට් නිෂ්පාදන සමාගමක නිෂ්පාදන කළමනාකරුවෙකු ලෙස සේවය කරයි. 2014/15 තක්සේරු වර්ෂය (මින්මතු "වර්ෂය" යැයි හැඳින්වෙන) සඳහා **රණසිංහ** සම්බන්ධ පහත සඳහන් තොරතුරු සපයා ඇත.

(1) ඔහුට රු.100,000/- බැගින් මාසික වැටුපක් ලැබී ඇත. 2015 ජනවාරි මාසයේදී නිෂ්පාදන දිරිදීමනාවක් ලෙස එක් මාසයක වැටුපක් ඔහුට ගෙවා ඇත.

(2) සමාගම ඔහුට ඉන්ධන සමඟ මෝටර් රථයක් (එන්ජින් ධාරිතාව - 2,000cc) සපයා ඇති අතර භාවිතය සම්බන්ධයෙන් ධාවන වාර්තා පවත්වා ගෙනගොස් නැත.

(3) ඔහු වාසය කරන්නේ මොරටුව ප්‍රදේශයේ පිහිටි කුලී නිවසක ය. නිවසේ කුලිය ඔහු විසින් දරනු ලබන අතර නිවසේ මාසික කුලිය රු.40,000/- කි. මාසිකව රු.50,000/- ක් බැගින් වූ වාසස්ථානය සඳහා දීමනාවක් ඔහුට සමාගමෙන් ලැබී ඇත.

(4) වර්ෂය තුළදී ඔහුගේ පුතු 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ අතර සමාගමෙන් රු.100,000/- ක ත්‍යාගයක් ලැබුණි. එම මුදල් බාලවයස්කාර ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කරනු ලැබිණි.

(5) ඔහුගේ දෙමාපියන්ගෙන් ඔහුට උරුම වූ නිවසක් මහනුවර පිහිටා ඇති අතර එය මසකට රු.20,000/- බැගින් 2014 ජනවාරි මාසයේ සිට කුලියට දී තිබේ. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.90,000/- ක් වන අතර 20% බැගින් වරිපනම් ගෙවා ඇත.

(6) වර්ෂය තුලදී, පහත පොලී ආදායම් ලැබී ඇත:

ස්ථාවර තැන්පතු මත : රු.69,000/- (8% බැගින් රඳවා ගැනීමේ බදු අඩුකල පසු)

බාලවයස්කාර ඉතිරිකිරීමේ ගිණුම මත : රු.3,000/-

(7) වර්ෂය තුලදී ඔහු ලංකා බැංකුවෙන් රු.500,000/- ක පුද්ගලික ණයක් ලබාගත් අතර, එම මුදල් ලැයිස්තුගත කොටස්වල ආයෝජනය කරන ලදී. මෙම ණය මුදල සඳහා පොලිය සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම ලෙස පිළිවෙලින් රු.52,000/- ක් සහ රු.190,000/- ක් ඔහු ගෙවා තිබුණි.

(8) වර්ෂය තුලදී ලැබුණු ලාභාංශවල සාරාංශය පහත දැක්වේ:

| | දළ ලාභාංශ (රු.) | රඳවාගැනීමේ බදු (රු.) | ශුද්ධ ලාභාංශ (රු.) |
|---|---|---|---|
| වෙනත් සමාගම් වලින් ලැබුණු ලාභාංශ වලින් ගෙවන ලද | 18,000 | 1,800 | 16,200 |
| ලාභ සහ ආදායම් වලින් ගෙවන ලද | 7,000 | 700 | 6,300 |
| **එකතුව** | **25,000** | **2,500** | **22,500** |

(9) වර්ෂය තුලදී **රණසිංහ** විසින් විකුණන ලද කොටස්වල විස්තර පහත පරිදි වේ:

| සමාගම | කොටස් ප්‍රමාණය | පිරිවැය (රු.) | විකුණුම් (රු.) | ලාභය (රු.) |
|---|---|---|---|---|
| **සීමාසහිත ABC පොදු සමාගම** | 10,000 | 186,000 | 220,000 | 34,000 |
| **සීමාසහිත PQR පොදු සමාගම** | 6,000 | 245,000 | 300,000 | 55,000 |
| **සීමාසහිත XYZ පොදු සමාගම** | 2,000 | 80,000 | 65,000 | (15,000) |
| | | **511,000** | **585,000** | **74,000** |

(10) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා ආයතනිකමය රැකවරණය සැලසීම සඳහා පිහිටුවන ලද අනුමත පුණ්‍යායතනයකට ඔහු රු.20,000/- ක් පරිත්‍යාග කොට ඇත. තවද, ඔහු "අපි වෙනුවෙන් අපි අරමුදලට" රු.100,000/- ක් පරිත්‍යාග කර ඇත.

(11) වර්ෂය සඳහා අඩුකර ඇති උපයන විට ගෙවන බද්ද (PAYE) රු.96,000/- කි.

(12) ඔහු රු.10,000/- ක ආදායම් බද්දක් ස්ව-තක්සේරු පදනම යටතේ ගෙවන ලදී.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින් කල යුතු දෑ:**

2014/15 තක්සේරු වර්ෂය සඳහා **රණසිංහගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**.

(a) බදු අයකල හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(c) ගෙවිය යුතු ඉතිරි බද්ද.

**සැ.යු:** යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කල යුතුය. (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **01 මට්ටම**<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **02 මට්ටම**<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **03 මට්ටම**<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |